රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 13/2001

මගේ අංක :- පී/1/3

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2001 ජුලි 4 දින

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

# 2001 අංක 2 දරණ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් සංශෝධන පනත - රජයේ නිලධාරිණීන්ගේ මනාපය පළ කිරීම.

1. 1983 අංක 231 සහ 1985 අංක 291 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක වීමට මනාපය පළ කිරීමට නොහැකි වූ නිලධාරිනීන්ට ඉහත සඳහන් පනත මගින් නැවත මනාපය පළ කිරීමට අවස්ථාව සලසා ඇත.

2. මනාපය පළ කළහැකි අවසාන දිනය 2002-02-22 විය යුතු බව රජය විසින් නියම කර ඇත.

3. ඉහත 01 වන ඡේදයේ සඳහන් චක්‍රලේඛ අනුව මනාපය පළ කර දායක වී නොමැති , 1983-08-01 දිනට ප්‍රථම විශ්‍රාම වැටුප් සහිත තනතුරකට පත් කරනු ලැබ එදින සේවයේ නියුක්තව සිටි නිලධාරිණීන් මෙම පනත අනුව 2002-02-22 දිනට පෙර සිය මනාපය පළ කල හැකිය.

4. 1. දැනට සේවයේ නිරතව සිටින මනාපය පළකිරීමට කැමති නිලධාරිණීන් තම දෙපාර්තමේන්තුප්‍රධානියා වෙත පරිශිෂ්ඨ 1 අනුව මනාප ප්‍රකාශය පිටපත් **තුනකින්** ඉදිරිපත් කල යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියා එම ප්‍රකාශ සහතික කර එක් පිටපතක් නිලධාරීන්ගේ පුද්ගලික ලිපි ගොනුවේ අමුණා තැබිය යුතුය. එක් පිටපතක් වැටුප් අංශයට භාරදිය යුතුය. අනෙක් පිටපත විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය. මනාපය පළ කල දිනට පසු මාසයේ සිට මාසික වැටුපෙන් දායක මුදල් අය කල යුතුය. 1983-08-01 සිට මනාපය පළ කල දින දක්වා හිඟ දායක මුදල් සියයට හතරක (4%) වැල් පොලියත් සමග වාරික 180 කින් වැටුපෙන් / විශ්‍රාම වැටුපෙන් අයකර ගත යුතුය. 1983-08-01 සිට වැටුපෙන් අය කලයුතු දායක මුදල් සියයට ගණන ඇමුණුම 1 ලෙසද වැල් පොළී ගණන් බැලිය යුතු ආකාරය ඇමුණුම 11 ලෙසද දායක මුදල් හා වැල් පොළී ගණනය කිරීම පිළිබඳ උදාහරණ ඇමුණුම 111 ලෙසද දක්වා ඇත.

   11. දැනට විශ්‍රාම ලබා ඇති මනාපය පළ කිරීමට කැමති නිලධාරිණීන්ද සිය මනාපය අවසාන වරට සේවය කල දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත පිටපත් තුනකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. ඔවුන් ගෙන් 1983.08.01 සිට විශ්‍රාම ගිය දින දක්වා කාලය තුළ ගෙවිය යුතු දායක මුදල් වාරික 180 කින් විශ්‍රාම වැටුපෙන් *අයකළ* යුතුය. ඉහත 1 හි සඳහන් පරිදි එසේ ගෙවිය යුතු හිඟ වාරික මුදල් හා වැල් පොලිය ගණන් බලා පිටපත් තුනකින් විශ්‍රාම වැටුප ගෙවන ප්‍රාදේශිය ලේකම් වෙත පරිශිෂ්ඨ 11 ආකෘතිය මගින් දන්විය යුතුය. ප්‍රාදේශිය ලේකම් විසින් අයකර ගැනීම් සටහන් කරගත් *බවට සහතික කර පිටපත් දෙකක්* දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ආපසු එවිය යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඉන් එක් පිටපතක් පෞද්ගලික ලිපිගොනුවට ගොනුකළ යුතු අතර අනෙක් පිටපත පරිශිෂ්ඨ 11 හි පිටපතක් සමග විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

111. මියගිය නිලධාරීන් සම්බන්ධයෙන් වූ විට ඔවුන් මනාපය පළකර නොමැති වුවද, දැනට මියගොස් ඇති හා මනාපය පළ කිරීමට ඉඩදී ඇති අවසාන දිනට පෙර මියයන නිලධාරීන් වෙනුවෙන් වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීමට සංශෝධිත පනතෙන් අවස්ථාව සැලසී ඇත. ඔවුන් වෙනුවෙන් පොදු 86 'අ' ආකෘතිය වැන්දඹු පුරුෂයා හෝ අනත්දරුවන්ගේ භාරකරු ලවා අත්සන් *කරවා ගෙන ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පත්වීම්* ලිපියේ පිටපතක්, විවාහ සහතිකය, මරණ සහතිකය, වැ.අ.වි.වැ.16 වාර්තාව, චරියා සටහන් සහ පොදු 55 විශ්‍රාම වැටුප් අයදුම්පත සකස් කර *විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ* වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

5 දායක වීමට මනාපය පළකරන නිලධාරීන් වෙනුවෙන් හැකි සෑම අවස්ථාවකම වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් ක්‍රමයේ *ලියාපදිංචි කිරීමට අවශ්‍ය පොදු 86 'අ' ආකෘතිය, විවාහ සහතිකය,* විශ්‍රාම වැටුප් සහිත පත්වීම් ලිපියේ සහතික පිටපත්, මනාප ප්‍රකාශ, මාසික දායක මුදල් සහ හිඟ දායක මුදල් පොලී සමග අයකර ගන්නා බවට සහතිකයක් සහ ඇමුණුම 111 උදාහරණය අනුව හිඟ දායක මුදල් සහ වැල් පොලි ගණන් බැලූ සටහන් පිටපතක් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.


6. පලාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීමට පෙර විශ්‍රාම ගිය හෝ මියගිය පළාත් පාලන සේවයේ නිලධාරීන්ට මෙම චක්‍රලේඛය අදාළ නොවේ.

7. අය කිරීම් ගිණුම්ගත කිරීම, විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 1/2001 අනුව කළයුතුය.

8. 1983.08.01 දිනට පෙර සේවා කාලය සඳහා දායක මුදල් පහත සඳහන් අන්දමට ගෙවීමට හෝ අය කර ගැනීමට හැකිය.

8 : 1 මෙම ක්‍රමය සඳහා මනාපය පළකල නිලධාරීන් , 1983.08.01 දිනට පෙර විශ්‍රාම වැටුප් සඳහා ගණන් ගතහැකි සේවා කාලය වෙනුවෙන් තමන් ලැබූ වැටුපින් සියයට හතරක (4%) දායක මුදලක් සියයට හතරක (4%) පොලියක් සමග තම කැමැත්ත පරිදි ගෙවිය හැකිය. එම ගෙවීම් එකවර හෝ තමන්ට කැමති වාරික ගණනකින්, සේවයේ සිටියදී වැටුපින් හෝ විශ්‍රාම ගියපසු පරිවර්තිත පාරිතෝෂිකයෙන් හෝ මාසික විශ්‍රාම වැටුපින් ගෙවිය හැකිය.

8 : 2 නිලධාරියා විසින් තමන් ජීවත්ව සිටි කාලය තුළ එසේ නොගෙවූ දායක මුදල්, ඇය වෙනුවෙන් වැන්දඹු පුරුෂයාට හෝ අනත් දරුවන්ට ගෙවිය යුතු විශ්‍රාම වැටුපින් අර්ථලාභීන්ගේ කැමැත්ත පරිදි අයකර ගතහැකිය. එසේ අයකිරීම් කරනු නොලැබූ කාලයක් වේනම් එසේ අය නොකල එක් එක් මාසය සඳහා ගෙවිය යුතු විශ්‍රාම වැටුපින් 1/600 බැගින් අඩු කරනු ලැබිය යුතුය.



එම්.එන්. ජුනයිඩ්.
ලේකම්
රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු හා
පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.

පිටපත් :- සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

## 1 පරිශිෂ්ඨය

2001 අංක 13/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාර මනාපය

(පිටපත් තුනකින් සැපයිය යුතුය.)

(1) නිලධාරිණියගේ නම :-
(2) උපන් දිනය :-
(3) දරනු ලබන තනතුර :-
(4) විශ්‍රාම වැටුප් සහිත තනතුරට පත් වු දිනය :-

2001.07.04 වැනි දින අංක 13/2001 දරන රා.පරි.චක්‍රලේඛය ප්‍රකාර . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . වන මම 2001 අංක 2 දරන පනතින් සංශෝධිත 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා *ක්‍රමයට බැඳීමට මෙයින් මනාපය පළකර* සිටිමි. මෙම මනාපය අවලංගු කළ නොහැකි බවත්, පසු අවස්ථාවකදී වෙනස් කර ගැනීමට මට ඉඩනොදිය හැකි බවත්, මම දනිමි.

නිලධාරිණියගේ අත්සන

දිනය :

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

ඉහත සඳහන් නිලධාරිණිය ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන බවත්, අංක 13/2001 සහ 2001.07.04 දින දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාර *මනාපය පළකර* සිටීමට සුදුසුකම් ඇති තැනැත්තියක බවත්, ඉහත සපයා ඇති විස්තර *කාර්යාලයේ වාර්තා සටහන් වලට අනුව නිවැරදි බවත් සහතික* කරමි.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/
විමධ්‍යගත ඒකකයේ ප්‍රධානියාගේ අත්සන.
දිනය : (නම සහ තනතුර ඇතුළත් මුද්‍රාව තබන්න.)

මගේ අංකය :

ලේකම් හා ගණකාධිකාරී,
වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් කාර්යාලය.

ඉදිරිපත් කරමි.

දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ/
විමධ්‍යගත ඒකකයේ ප්‍රධානියා ගේ අත්සන.
දිනය : (නම සහ තනතුර ඇතුළත් මුද්‍රාව තබන්න.)

ලකිය යුතුයි :- මෙම මනාපයේ එක් පිටපතක් නිලධාරිණියගේ පෞද්ගලික ලිපිගොනුවේ ගොනුකර තැබිය යුතුයි. එක් පිටපතක් වැටුප් අංශයට භාරදිය යුතුය.

11 පරිශිෂ්ඨය

(පිටපත් තුනකින් සැපයිය යුතුයි.)

මගේ අංකය:

ප්‍රාදේශීය ලේකම්,

. . . . . . . . . . . .

**2001 අංක 2 දරණ පනතින් සංශෝධිත 1983 අංක 24 දරණ වැන්දඹු පුරුෂ අනාථ්දරු විශ්‍රාම වැටුප් පනත අනුව අයකල යුතු හිගදයක මුදල් සහ පොලී මුදල්**

පහත විස්තර සදහන් විශ්‍රාමික නිලධාරිණිය අංක 13/2001 සහ 2001.07.04. දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේ්‍ය අනුව වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍ර*මයට දයක* විමට මනාපය පළකර ඇත.

1983.08.01 දින සිට ඇය විශ්‍රාම ගිය . . .. . . . . . . . දින දක්වා ඇයගේ වැටුපෙන් අයවිය යුතු දයක මුදල් සහ පොලිය එකතුව රු . . . . කි. එම මුදල රු.. . . . (අකුරින්) බැගින් වු එක් වාරිකයකින් හා රු:. . . . . බැගින් වු වාරික 179 කින් 200 . . . . . . . . . . . . මස සිට අයකර ගැනිමට සටහන් කරගෙන ඒ බව මා වෙත දැනුම් දෙන්න.

(1) විශ්‍රාමිකාවගේ නම :-

(2) විශ්‍රාම ගිය දිනය :-

(3) දැරූ තනතුර :-

(4) විශ්‍රාම වැටුප් අංකය :-

(5) විශ්‍රාම වැටුප් ලබා ගන්නා බැංකුව/තැපැල් කාර්යාලය :-

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :-

මගේ අංකය :

. . . . . ... . . . . . . . . .

. . . . . . . . . . . .

අංක. . . . . . . . . . . . . . . . යටතේ විශ්‍රාම වැටුප් ලබන .. . . . . . . . . . . . . . . . . . . මහත්මියගේ විශ්‍රාම වැටුපෙන් 200 . . . . . . . මස සිට 20 .. . . . .. .. . . මාසය දක්වා රු:. . . . . . වාරිකයකින් සහ රු:. . . . . . බැගින් වු වාරික 179 කින් ද, *වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් දයක* මුදල් අයකර 07 - 010 ආදයම් ශීර්ෂයට බැර කිරිමට සටහන් *කරගත් බව සහතික* කරමි.

ප්‍රාදේශීය ලේකම්

(නම සහ තනතුර ඇතුළත් මුද්‍රාව තබන්න.)

දිනය :. . . . . . . . .

ඇමුණුම 1

ඒකාබද්ධ වැටුප් මත අයකල යුතු වැ. පු. අ. වි. වැ. දායක මුදල් ප්‍රතිශතයන්.

දායක මුදල් අවකරණ පිළිවෙල.

| | | |
|---|---|---|
| 1983.08.01 සිට 1986.01.01 දක්වා | – 8580/= දක්වා | 1 1/2% |
| | 8581/= සිට 15600/= දක්වා | 3% |
| | 15601/= සිට ඉහලට | 4% |
| 1986.01.01 සිට 1987.12.31 දක්වා | – 8640/= දක්වා | 1 1/2% |
| | 8641/= සිට 15600/= දක්වා/= | 3% |
| | 15601/= සිට ඉහලට | 4% |
| 1988.01.01 සිට 1988.12.31 දක්වා | – 17280/= දක්වා | 1 1/2% |
| | 17281/= සිට 28800/= | 3% |
| | 28801/= සිට ඉහලට | 4% |
| 1989.01.01 සිට 1992.12..31 දක්වා | – 17280/= දක්වා | 3% |
| | 17281/= සිට 28800/= දක්වා | 5% |
| | 28801/= සිට ඉහලට | 6% |
| 1993.01.01 සිට1996.12.31 දක්වා | – 23400/= දක්වා | 3% |
| | 23401/= 35700/= | 5% |
| | 35701/= සිට ඉහලට | 6% |
| 1997.01.01 සිට …………….. | – 45600/= දක්වා | 4% |
| | – 45601 – 70260 | 6% |
| | – 70261 සිට ඉහලට | 7% |

ඇමුණුම II

இணைப்பு 11

Annex II

වැ.පු.අ.වි.වැ. දායක මුදල් රු. 1/- ක් සඳහා සියයට හතරක (4%) වැල්පොලිය

**வி.அ.ஓ. பங்குதார நிதி ரூபா 1/-க்காக நான்கு (4%) சதவீத கூட்டுவட்டி**

Four percent (4%) compound interest for the W & O P contribution for Rs: 1/-

| වර්ෂය<br>ஆண்டு<br>Year | වර්ෂය අවසානයේ වැල් පොලිය සමග මුළු මුදල<br>ஆண்டு முடிவில் கூட்டு வட்டியுடன் மொத்தத் தொகை<br>Full amount including compound interest at end of the year |
|---|---|
| 1 | 1.0400 |
| 2 | 1.0816 |
| 3 | 1.1249 |
| 4 | 1.1699 |
| 5 | 1.2167 |
| 6 | 1.2653 |
| 7 | 1.3159 |
| 8 | 1.3686 |
| 9 | 1.4233 |
| 10 | 1.4802 |
| 11 | 1.5395 |
| 12 | 1.6010 |
| 13 | 1.6651 |
| 14 | 1.7317 |
| 15 | 1.8009 |
| 16 | 1.8730 |
| 17 | 1.9479 |
| 18 | 2.0258 |
| 19 | 2.1068 |
| 20 | 2.1911 |